“ජනයා අතර කරුණු දෙකක් පවතී. ඒ දෙක ඔවුනට දේවත්වය ප්රතික්ෂේප කිරීම ඇති කරනු ඇත. එනම්: පෙළපත සම්බන්ධයෙන් දොස් නැගීම හා මිය ගිය ඇත්තන් මත මොර දී විලාප දීමය.”

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. “ජනයා අතර කරුණු දෙකක් පවතී. ඒ දෙක ඔවුනට දේවත්වය ප්රතික්ෂේප කිරීම ඇති කරනු ඇත. එනම්: පෙළපත සම්බන්ධයෙන් දොස් නැගීම හා මිය ගිය ඇත්තන් මත මොර දී විලාප දීමය.”
[صحيح] [رواه مسلم]

ජනයා අතර පවතින දේවත්වය ප්රතික්ෂේප කරන ක්රියාවන් හා අඥාන යුගයේ සිරිත්විරිත් අතරින් කරුණු දෙකක් පිළිබඳ නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ දන්වා සිටියහ. ඒ දෙක නම්: පළමුවැන්න: මිනිස් පරම්පරාවන් පිළිබඳ අපහාස කිරීම, ඔවුන් පිළිබඳ අඩුපාඩු පැවසීම හා ඔවුනට එරෙහිව අහංකාරකම් පෑමය. දෙවැන්න: අනතුරක් සිදු වූ අවස්ථාවක පෙර නියමය මත ඇති කෝපයෙන් කෑ ගැසීම හෝ දැඩි පීඩනය හේතුවෙන් ඇඳුම් ඉරා ගැනීමය.

https://sunnah.global/hadeeth/si/show/6361